# ඉන්දියානු ආභාසය ලැබූ 'වඩිග පටුන' නර්තනය පිළිබඳ අධ්‍යයනයක්

***කුමාරි, ඒ. බී. නදීකා ධනුෂි*** [1]

දේශීය නර්තන සම්ප්‍රදායේ එන ශාන්තිකර්ම බොහෝමයක් අතරින් පහතරට නර්තන සම්ප්‍රදායට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. දෙවියන්ගෙන්, යකුන්ගෙන්, ග්‍රහයින්ගෙන් වන්නා වූ දෝෂයන් මග හරවා ගැනීම උදෙසා ශාන්තිකර්ම පවත්වති. ඒ අනුව ශාන්ති කර්මවල දක්නට ලැබෙන ඇඳුම්-පැළඳුම්, රංග වස්ත්‍රාභරණ, වර්ණ, අංගහාර විධි, රංග භාණ්ඩ, දෙබස්, අංගරචනය ආදි වූ අංග සියල්ලෙහිම ඉන්දියානු සම්භවයකින් දේශීය නර්තනයට එකතු වන ඇතැම් කොටස් බොහෝය. සූනියම් ශාන්තිකර්මය ඒ අතරින් වඩාත් කැපී පෙනෙන ශාන්තිකර්මයකි. ඒ අනුව පහතරට නර්තන සම්ප්‍රදායේ එනු ලබන සූනියම් ශාන්තිකර්මය සුවිශේෂී වන්නේ එහි එන '**වඩිග පටුන නර්තනය**' නිසාවෙනි. ඉන්දියාව ලංකාවට ආසන්නතම රට මෙන්ම අතීතයේ පටන් ඉන්දියානු ජන කණ්ඩායම් අප රටට සංක්‍රමණය වු අතර එමගින් අපට බොහෝ විට ලැබුණේ සංක්‍රමණය වූවන්ගෙන් ගොඩ නැගුණු අංගයන්ය. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වශයෙන් තෝරා ගනු ලැබූයේ ඉන්දියානු ආභාසය මත '**වඩිග පටුන නර්තනය**' ගොඩ නැගෙන්නේද? එසේ නම් ඒ අංග මොනවාද? යන්න සොයා බැලීමයි. මෙහිදී පහතරට ප්‍රදේශයේ ශාන්තිකර්ම ඇදුරන්ගෙන් ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරමින් සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් දත්ත එක් රැස් කළ අතර, ද්විතීයික දත්ත ඔස්සේ දැනට භාවිතයේ පවතින පහතරට ශාන්තිකර්ම හා සම්බන්ධ පොත්, ශාස්ත්‍රීය ලිපි සහ සඟරා ඔස්සේ දත්ත එකතු කර ගන්නා ලදි. මෙම පර්යේෂණයේ නිගමනය වශයෙන් ලැබුයේ සූනියම් ශාන්තිකර්මයේ '**වඩිග පටුන**' නර්තනය ඉන්දියානු ආභාසය මත ගොඩ නැගුණු බවයි.

ප්‍රමුඛ පදඃ වඩිග පටුන, ශාන්තිකර්ම, නර්තනය, බ්‍රාහ්මණ සංකල්පය, සම්ප්‍රදාය

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, ජන සන්නිවේදන අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*abnadeekadk@gmail.com*